ද මැසිනොද් විදුහල කඳාන
De Mazenod College - Kandana

# චිත්‍ර කලාව - I

පැය 3

දෙවන වාර පරීක්ෂණය - 2018 | 12 ශ්‍රේණිය

26.03.2018

අංක 1 සිට 05 දක්වා ප්‍රශ්න වලට නිවැරදි පිළිතුරු සපයන්න.

01) ඉන්දීය ගුප්ත යුගයේ ඉදිවූ ........................................ බුදු පිළිමය තුළින් පස්වන තවුසන්ට දම් දෙසූ අවස්ථාව නිරූපනය කෙරේ.

02) ශ්‍රී ලංකාව විදේශ ආදීපත්‍යයට නතුව පැවති සමයක ........................................ ශිල්පියා විසින් බෞද්ධ ප්‍රබෝධයක් ඇතිකරලීම සඳහා බෞද්ධ සිතුවම් කීපයක් නිර්මාණය කරන ලදි.

03) බොරැල්ල සියලු සාන්තුවරයින්ගේ දේවස්ථානය ප්‍රසිද්ධියක් උසුලන්නේ ........................................ භාවිත කර ක්‍රිස්තුස් වහන්සේගේ ජීවන චරිතය ඇසුරින් නිර්මානය කරන ලද සිතුවම් නිසාය.

04) ස්ටෙන්සා ඩෙලා සිග්නැචුරා ශාලාවේ දක්නට ඇති රෆායෙල් විසින් අඳින ලද ........................................ නැමති සිතුවමින් පර්යාවලෝක රීතිය පිළිබඳව ඔහු දැක්වූ කුසලතාවත් දාර්ශනික ජීවිතය පිළිබඳ ලත් පරිණත අවබෝධයත් මැනවින් නිරූපණය වේ.

05) නූතන යුගයට අයත් චිත්‍ර ශිල්පියෙකු වන ඩේවිඩ් ජේන්ටර් විසින් නිර්මාණය කළ ජයග්‍රාහී ලෙස ජෙරුසලමට ඇතුළුවීම නම් චිත්‍රය ........................................ දක්නට ඇත.

ප්‍රශ්න අංක 6 සිට 10 දක්වා දී ඇති හිස්තැන් පිරවීම සඳහා පහත ඡායාරූපය ඇසුර කර ගන්න.



Learning Resource Center
R
De Mazenod College
Kandana

පැබ්ලෝ පිකාසෝ විසින් අඳින ලද 06) ........................................ නම් මෙම සිතුවමින් දෙවන ලෝක යුද්ධ සමයේ ගුවර්නිකා නම් නගරයට බෝම්බ හෙළීමක් සිදුවූ බිහිසුනු බව දැක්වේ. චිත්‍රයේ හැඟීම් ප්‍රකාශ කිරීම සඳහා පිකාසෝ විසින් 07) ........................................ හා ........................................ රූපවල විවිධ කොටස් මැනවින් සංරචනය කොට ඇත. මේ සඳහා භාවිත රූප 08) ........................................ හැඩයන්ගෙන් යුක්ත වූ අතර. එම හැඩ බාහිර කායික සුන්දරත්වය වෙනුවට 09) ........................................ හැඟීම් මැනවින් ප්‍රකාශ කිරීමට සමත්වී ඇත. මෙම සිතුවම 10) ........................................ මාධ්‍යයෙන් ........................................ මත නිර්මාණය කරන ලද්දකි.

ප්‍රශ්න අංක 11 සිට 15 තෙක් දී ඇති ප්‍රශ්නවලට නිවැරදි පිළිතුරු සපයන්න.

11) ගම්පල යුලයේදී හමුවන ගඩලාදෙණියට පමණක් සුවිශේෂ වූ නිර්මාණ අංගය කමක්ද ?

12) ඇතා සහ ඇත් පැටවා නම් සිතුවම දක්නට ඇත්තේ කොහේද ?

13) ඇම්බැක්කේ දේවාලයේ බාල්කයක කැටයම් කර ඇති අගනා නිර්මාණය කුමක්ද?


14) බෞද්ධ චිත්‍ර කලාව කෙරෙහි දැඩි ඇල්මක් දක්වූ. විහාර බිතු සිතුවම් පිටපත් කිරීමේ හා සංරක්ෂණය කිරීමේ කාර්යක යන නියැලුණු ශිල්පියා කව්ද ?

15) 1963දී බ්‍රසීලයේ පැවැත්වූ ප්‍රදර්ශනයකදී ඔහු විසින් ඉදිරිපත් කළ විපාකය නම් ලෝකඩ මූර්තියට විශිෂ්ඨ ගෞරව සම්මානයක් හිමි විය. එම ශ්‍රී ලාංකික ශිල්පියා වන්නේ,


ප්‍රශ්න අංක 16 සිට 20 දක්වා දී ඇති ප්‍රශ්නවලට A,B,C,D,E, යන රූප සටහන් ඇසුරෙන් නිවැරදි පිළිතුරු සපයන්න.



A



B



C



D



E

16) මානව රුවේ සුන්දරත්වය, මාංශ පේශීන්ගේ ජවය තාත්වික ලෙස ඉදිරිපත් කර ඇති මූර්තියේ නම කුමක්ද ?

17) ආභාරණවලින් පිරුණු අඟ පසඟ, තරුණ පෙනුම තිවංක ඉරියව්ව පෙන්නුම් කරන මූර්තිය කුමක්ද ?

18) ප්‍රතාපවත් බව, රණ ශූරත්වය, ඍජු බව පෙන්වන මූර්තියේ නම කුමක්ද ?

19) ආගමික සංකල්පයක් නිරූපණය කරන මැටියෙන් කළ සරල හැඩ සහිත මූර්තිය කුමක්ද ?

20) ස්වභාවික හා තාත්වික හැඩ වෙනුවට ව්‍යුක්ත හැඩ භාවිතා කළ මූර්තිය කුමක්ද ?

● ප්‍රශ්න අංක 21 සිට 25 තෙක් අසා ඇති ප්‍රශ්නවලට වඩාත් නිවැරදි පිළිතුර පහත සඳහන් F, G, H, I, J යන චිත්‍ර ඇසුරෙන් තෝරන්න.



F



G



H



I



J

21. F අක්ෂරයෙන් දක්වෙන විසිතුරු වර්ණ සිතුවම,
    (1) ව්‍යුක්ත රූපී නිදහස් හැඩතල යොදා ගනිමින් කළ නිර්මාණයකි.
    (2) සුමන දිසානායක විසින් නිර්මාණය කරන ලද බතික් සැරසිල්ලකි.
    (3) එල්. ටී. පී. මංජු ශ්‍රී විසින් ව්‍යුක්ත රූපී හැඩතල ඇසුරින් කළ සුබ පැතුම් පතකි.
    (4) සුමන දිසානායක ළමා පොතකට කළ සන්නිදර්ශන සිතුවමකි.
    (5) බතික් ක්‍රමයට වත්මන් ශිල්පියකු විසින් කළ නව නිර්මාණයකි. (..........)

22. G අක්ෂරයෙන් දක්වෙන ද්‍රව්‍ය සම්පිණ්ඩන සිතුවම,
    (1) නූතන චිත්‍ර ශිල්පියකු විසින් සංරචනය කළ නිශ්චල ද්‍රව්‍ය සම්පිණ්ඩන චිත්‍රයකි.
    (2) වස්තූන්ගේ ස්වභාවික ලක්ෂණ නොසලකා හැර කරන ලද නිර්මාණයකි.
    (3) නිදහස් සංරචන රටාවක් ඇසුරෙන් නිර්මාණය වූ ද්‍රව්‍ය සම්පිණ්ඩනයකි.
    (4) ඩබ්ලිව්. ජේ. ජී. බීලින් ශිල්පියා විසින් ව්‍යුක්ත හැඩතල භාවිතයෙන් කළ සිත්තමකි.
    (5) ජෝර්ජ් කීට් විසින් ඝණිකවාදී සංකල්ප මත කරන ලද නිර්මාණයකි. (..........)


23. H අක්ෂරයෙන් නිරූපිත චිත්‍රය,
    (1) ඉන්දීය ජන ජීවිතයේ සාම්ප්‍රදායික ලක්ෂණ නිරූපණය කෙරෙන ජෙමිනි රෝයිගේ සිතුවමකි.
    (2) අම්රිතා ශෙර්ගිල් විසින් සිතුවම් කරන ලද 'කාන්තාවන් තිදෙනා' නමින් හැඳින්වෙන සිතුවමකි.
    (3) 'මනාලිය' නමින් හැඳින්වෙන ඉන්දීය නූතන ශිල්පියකුගේ නව නිර්මාණයකි.
    (4) 'කඳුකර යුවතියෝ' නමින් නන්දලාල් බෝස් විසින් කරන ලද නිර්මාණයකි.
    (5) ඉන්දීය ජන ජීවිතය විග්‍රහ කෙරෙන අබනීන්ද්‍රනාත් තාගෝර්ගේ සිතුවමකි. (..........)

24. I අක්ෂරයෙන් දක්වෙන මැඩෝනා චිත්‍රය,
    (1) ඇල්බා මැඩෝනා නමින් හැඳින්වේ.
    (2) සිස්ටයින් මැඩෝනා නමින් හැඳින්වේ.
    (3) මැඩෝනා ඔෆ් ද ඩියුක් නමින් හැඳින්වේ.
    (4) මැඩෝනා ඔෆ් ද මෙඩෝ නමින් හැඳින්වේ.
    (5) මැඩෝනා විත් ෆිෂ් නමින් හැඳින්වේ. (..........)


25. J අක්ෂරයෙන් දක්වෙන හින්දු ආගමික මූර්තිය,
    (1) අප්පර්ස්වාමි නිරූපණය කෙරෙන චෝළ මූර්තියකි.
    (2) සුන්දර මූර්ති නිරූපණය කෙරෙන හින්දු මූර්තියකි.
    (3) විෂ්ණු දෙවියන් නිරූපණය කෙරෙන පල්ලව මූර්තියකි.
    (4) වීනාධර නමින් හැඳින්වෙන චෝළ මූර්තියකි.
    (5) නටරාජා නිරූපණය කෙරෙන චෝළ මූර්තියකි. (..........)

● අංක 26 සිට 30 තෙක් ප්‍රශ්නවලට පහත දැක්වෙන ඡායාරූප ඇසුරෙන් පිළිතුරු සපයන්න.


K



L



M



N



O



26 K අක්ෂරයෙන් දැක්වෙන වාස්තු විද්‍යා නිර්මාණය ගම්පොළ යුගයේ නිර්මාණය වූවකි. මෙය නිර්මාණය කළ ශිල්පියා කවු ද ?

..........................................................................................................................................

27 L අක්ෂරයෙන් දැක්වෙනුයේ 43 කණ්ඩායමේ ශිල්පියකු වන එල්. ටී. පී. මංජු ශ්‍රී ගේ සිතුවමකි. මෙය නම් කර ඇත්තේ කුමන නමකින් ද ?

..........................................................................................................................................

28 M අක්ෂරයෙන් දැක්වෙනුයේ උපස්ථිතිවාදී ශිල්පියකුගේ නිර්මාණයක් වන වෝටර්ලූ පාලම නම් වූ සිතුවමයි. මෙය නිර්මාණය කළ ශිල්පියා කවුද ?

..........................................................................................................................................

29 N අක්ෂරයෙන් දැක්වෙන යක්ෂිණී රුව කුමන නිර්මාණයකට සම්බන්ධ වූවක් ද ?

..........................................................................................................................................

30 O අක්ෂරයෙන් දැක්වෙන මැටි බඳුන ඉතා දියුණු චිත්‍ර කලාවක ලක්ෂණ පිළිබිඹු කරයි. මෙය හමුවන්නේ කිනම් රටක කලා නිර්මාණ ආශ්‍රයෙන් ද ?

..........................................................................................................................................


26.03.2018 ~~ඉතිහාසය~~ චිත්‍ර. 12 ශ්‍රේණිය.

● ප්‍රශ්න අංක 31 සිට 35 තෙක් අසා ඇති ප්‍රශ්නවලට වඩාත් නිවැරදි පිළිතුරු පහත සඳහන් P, Q, R, T, S මගින් දැක්වෙන මූර්ති ඇසුරෙන් තෝරන්න.


P


Q


R


T


S

31 P අක්ෂරයෙන් දැක්වෙන මූර්තිය,
(1) තාත්ත්වික ලක්ෂණ නිරූපණය කරන්නකි.
(2) ශෛලිගත ලක්ෂණ නිරූපණය කරන්නකි.
(3) රාජකීයකුගේ ලක්ෂණ නිරූපණය කරන්නකි.
(4) සංකේතාත්මක ප්‍රකාශනයෙන් යුතු හින්දු දෙවියකු නිරූපණය කරන්නකි.
(5) ඉන්දු නිම්න වැසියන් සතු ඇඹීමේ කුසලතාව පිළිබිඹු කරන්නකි. (.........)

32 Q අක්ෂරයෙන් දැක්වෙන ඉන්දීය ශිල්පියකුගේ ප්‍රශස්ත නිර්මාණය,
(1) ගන්ධාර කලා සම්ප්‍රදාය අනුව නිම වූ මූර්තියකි.
(2) මථුරා ගුරු කුලය තුළ නිම වූ අගනා නිර්මාණයකි.
(3) සාරානාත්වලින් හමු වූ මථුරා ගුරු කුලයේ නිර්මාණයකි.
(4) පද්මාසන ක්‍රමයෙන් වැඩ හිඳින සාරානාත් හි හමුවන එක ම පිළිමයයි.
(5) ගන්ධාර ශිල්පීන් විසින් නෙළන ලද, සාරානාත් කෞතුකාගාරයේ දක්නට ඇති පිළිමයකි. (... .....)

33 R අක්ෂරයෙන් දැක්වෙන වේගවත් චලන ඉරියව් නිරූපිත මූර්තිය,
(1) මානව රුවේ ක්‍රියාකාරී ඉරියව්වක් කිරිගරුඬ මාධ්‍යයෙන් මූර්තිමත් කිරීමට ගත් උත්සාහයකි.
(2) ග්‍රීක හෙලනිස්ටික් යුගයේ දක්ෂ මූර්ති ශිල්පියකුගේ නිර්මාණයකි.
(3) ප්‍රැක්සිටෙලස් ශිල්පියාගේ විශිෂ්ටතම නිර්මාණයකි.
(4) රෝම ශිල්පියකු විසින් වාත්තුකරන ලද ලෝකඩ මූර්තියකි.
(5) ග්‍රීක සම්භාව්‍ය යුගයේ ශිල්පියකු වූ ඇන්ටිසෝඩිගේ නිර්මාණයකි. (........)

34 S අක්ෂරයෙන් දැක්වෙන්නේ,
(1) මරිය මව්තුමිය ජේසු බිළිඳාට මල් ඉත්තක් දෙන අයුරු මයිකල් ආන්ජලෝ විසින් සිතුවම් කළ අවස්ථාවකි.
(2) 'ජේසු බිළිඳා සහ කානේෂන් මල' නම් වූ ඩාවින්චිගේ සිතුවමයි.
(3) රෆායල්ගේ මැඩෝනා චිත්‍ර අතර හැඟුම්බර අවස්ථාවක් නිරූපිත චිත්‍රයකි.
(4) දේවස්ථාන බිත්තියක රෆායල් විසින් සිතුවම් කරන ලද ජේසු බිළිඳා පිළිබඳ පුවතකි.
(5) ඩාවින්චි විසින් අඳිනු ලැබූ ජේසු බිළිඳාගේ කෙළිලොල් දිවිය පිළිබඳ පුවතකි. (..........)

35 මෙහි දැක්වෙනුයේ, T
(1) ග්‍රීක ශිල්පක්‍රම අනුකරණය කරමින් රෝමවරුන් විසින් වැඩිදියුණු කරන ලද කුලුනු විශේෂයකි.
(2) ග්‍රීකයන් තම ගෘහ නිර්මාණයන්ගේ ප්‍රථමයෙන් ම භාවිත කළ කුලුනු විශේෂයකි.
(3) මිසර වැසියන් භාවිත කළ, ග්‍රීකයන්ට මූලාදර්ශ වී ඇති කුලුනු විශේෂයකි.
(4) ග්‍රීකයන්ගේ එක් ගෘහනිර්මාණ ශෛලියක් වන අයොනික් කුලුනු විශේෂයකි.
(5) පැරණි ග්‍රීක වාස්තු විද්‍යා නිර්මාණයක් වන පාතිනන් දේවොලේ කුලුනු විශේෂයකි.

Learning Resource Center
R
De Mazenod College
Kandana

පහත දැක්වෙන ඡායාරූපය ඇසුරුකොටගෙන අංක 36 සිට 40 තෙක් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.



36- මෙම සිතුවම ........................................................ ගර්භ ගෘහයේ ඇති චිත්‍රයකින් උපුටා ගන්නා ලද කොටසකි.

37- 12 වන ශත වර්ෂයේදී ........................................................ රජතුමා විසින් මෙම ප්‍රතිමා ගෘහය කරවූ බව සඳහන් වේ.

38- ........................................................ නම් වූ මෙම සිතුවම තුළින් බෝසතුන්ට මනුලෝව උපදින ලෙස කළ ඇරයුම පිළිබිඹු වේ.

39- මෙම සිතුවම අමතරව මේ ප්‍රතිමා ගෘහයේ ඇති අනෙත් සුවිශේෂී සිතුවම ........................................................ ........................................................ ලෙස හැඳින්වේ.

40- මෙම සිතුවම ........................................................ යුගයට අයත් වේ.